# කොමියුනිස්ට් ප්‍රකාශනය අද

ලියොන් ට්‍රොට්ස්කි

(කොමියුනිස්ට් ප්‍රකශනයේ ප්‍රථම අප්‍රිකන් භාෂා සංස්කරණය සඳහා වූ හැඳින්වීම - 1937 )

කොමියුනිස්ට් පක්ෂ ප්‍රකාශනයේ ශත සංවත්සරයට තවත් ඇත්තේ අවුරුදු දහයක් පමණක්ය යන්න විශ්වාස කිරීම පවා අමාරුය. ලෝක සාහිත්‍යයේ අන් කිසිම ලියවිල්ලකටත් වඩා අධිනිපුනත්වයක් පෙන්නුම් කරන එම ලියවිල්ල එහි නවතාවයෙන් අදත් අප වික්ෂිප්ත කරයි. එහි වඩාත්ම වැදගත් වගන්තිය මේ ඊයේ ලියන ලද ඒවා වැන්න. සහතික වශයෙන්ම මෙම තරුණ කතුවරයින්ට (එවකට මාක්ස්ට වයස 29 ක් වූ අතර එංගල්ස්ට 27 ක් විය.) තමන්ට පෙර විසූ කිසිවෙකුටත් වඩා ඇතැම් විට තමන්ට පසුව විසූ කිසිවෙකුටත් වඩා අනාගතය දෙස ඈතට බැලීමට පිළිවන් වී ඇත.

කොමියුනිස්ට් ප්‍රකාශනයේ එන ඇතැම් ද්විතීයික ඡේදයන් යල් පිනූ ඒවා වී නමුත් ප්‍රකාශනය ඒ වන විට අවුරුදු විසිපහක් අතරතුර කාල පරිච්ඡේදයක් තුළ ඓතිහාසික ලියවිල්ලක් බවට පත්වී තිබුණු හෙයින් එහි මුල් ග්‍රන්ථයේ පිටපත වෙනස් කිරීමට තමන්ට තවදුරටත් අයිතියක් නොමැති බව 1872 සංස්කරණය සඳහා වූ ඒකාබද්ධ සංඥාපනයෙන් මාක්ස් සහ එංගල්ස් පළකර සිටියහ. ඒ කාලයෙන් පසු තවත් අවුරුදු හැටක් ගතවී ඇත. ප්‍රකාශනයේ ඇතැම් තනි තනි ඡේදයන් අතීතය වෙත තව තවත් තල්ලුවී ඇත. ප්‍රකාශනයේ ඇති අදත් සම්පූර්ණ ශක්තිය රදා පවතින්නා වූද එමෙන්ම වැදගත් වෙනස් කිරීම් හෝ පැහැදිලි කිරීම් අවශ්‍ය වන්නා වූ ද අදහස් මෙම සංඥාපනයෙන් පැහැදිලි ලෙස තහවුරු කිරීමට අපි උත්සාහ කරමු.

01 ප්‍රකාශනයට ඉතා ස්වල්ප කාලයකට පෙර සොයාගෙන වියත් ප්‍රාගුණ්‍යයකින් ප්‍රකාශනයේදී යොදා ගනු ලැබූ ඉතිහාසය පිළිබඳ භෞතික වාදී සංකල්ප සිද්ධීන්ට හා සතුරු විවේචකයින්ට සම්පූර්ණයෙන්ම සාර්ථක ලෙස මුහුණ දී ඇත. එය අද මනුෂ්‍ය චින්තනයේ ඉතාමත්ම වටිනා ආයුධයක් වී තිබේ. ඓතිහාසික ක්‍රියාදාමය පිළිබඳ අන් සියලුම අර්ථ නිරීපනයන්ගේ සියලු විද්‍යාත්මක අර්ථ අහෝසි වී ගොස් ඇත. ඉතිහාස පිළිබඳ භෞතිකවාදී අර්ථ නිරූපණය උකහා නොගෙන අපගේ කාලයේදී සටන් කාමී විප්ලවවාදියකු වීමට පමණක් නොව දේශපාලනය ගැන තතු දත් නිරීක්ෂකයෙකු වීමටවත් බැරි බව අපට ස්ථිර ලෙසම ප්‍රකාශ කළ හැකිය.

02. ප්‍රකාශනයේ ප්‍රථම පරිච්ඡේදය විවෘත වන්නේ පහත සඳහන් වචන වලිනි. "මෙතුවක් කල් පැවති සියළු සමාජයන්හි ඉතිහාසය පන්ති සටන් පිළිබඳ ඉතිහාසයයි. ඉතිහාසය පිළිබඳ භෞතිකවාදී අර්ථ නිරූපනය මගින් බැසගත් ඉතාම වැදගත් නිගමනය වූ මෙම සිද්ධාන්තය පන්ති සටන් පිළිබඳ ප්‍රශ්නයක් බවට වහාම පත් විය. "පොදු සුභ සිද්ධිය" "ජාතික සමගිය" හා "සදාතනික සදාචාරාත්මක සත්‍යයන්" වෙනුවට ඉදිරිපත් වුණු භෞතික ඕනෑ එපාකම්වල අරගලය පෙරට යවන බලවේගය බවට පත්කලා වූ මෙම න්‍යායට විරුද්ධව ප්‍රතිගාමී කුහකයින් ලිබරල්වාදී ධර්ම දේශකයින් හා විඥානවාදී ප්‍රජාතන්ත්‍රවාදී විසින් විශේෂයෙන්ම විසකුරු ප්‍රහාරයක් එල්ල කරන ලදි. කම්කරු ව්‍යාපාරයේම පිරිස් අතරින්ම තෝරාගත් අය, ඊනියා සංශෝධනවාදීන්, එනම් පංති සංයෝගයේ සහ

පංති සහජීවනයේ ජීවයෙන් මාක්ස්වාදය විචාරය කිරීමේ (සංස්කරණය කිරීමේ) මතධාරීන්, කොමියුනිස්ට් ජාත්‍යන්තරයේ තුච්ඡ වූ එපිගුන්වරුන් (ස්ටැලින්වාදීන්) විසින් ප්‍රායෝගික වශයෙන් මෙම මාර්ගයෙම අනුගමනය කරන ලදි. මොවුනගේ ඊනියා මහජන පෙරමුණු පිළිවෙත පංති සටනේ නියාමයන් නිෂේධ කිරීමෙන් එහෙම්පිටින්ම මතුවී එන්නකි. කොමියුනිස්ට් ප්‍රකාශනයට එහි උත්තරීතර න්‍යායික විජයග්‍රහනය ලබා දෙන්නේ සියළුම සමාජ ප්‍රතිවිරෝධයන් උච්ඡතම ආතතියේ ලක්‍ෂය කරා ගෙන එන්නා වූ අධිරාජ්‍යවාදී යුගය විස්නමය.

03. සමාජයේ ආර්ථික වර්ධනයේ සුවිශේෂී අදියරක් වශයෙන් ධනවාදී ව්‍යූහය පරිපූර්ණ නිමාවෙන් යුතුව මාක්ස් විසින් ප්‍රාග්ධනය (1877) නැමැති ග්‍රන්ථය ඉදිරිපත් කරන ලදි. එහෙත් ශ්‍රම ශක්තිය සඳහා කරන ගෙවීම් ප්‍රති නිෂ්පාදන මිලට සමාන වීම, ධනපතීන් අතිරික්ත වටිනාකම සන්තක කර ගැනීම, සමාජ සම්බන්ධතාවයන්ගේ මූළික නියාමය වශයෙන් තරඟය සැලකීම, අතුරු පංතීන් එනම් නාගරික සුළු ධනේශ්වර හා ගොවි ජනතාව විනාශ වීම, එන්ට එන්නම හීනවන දේපළ හිමියන් සංඛ්‍යාවක් අත එක් ධ්‍රැවයක දේපළ ඒකරාශී වීම හා අනික් ධ්‍රැවයේ සංඛ්‍යාත්මකවශයෙන් කම්කරු පංතියේ වැඩීම, සමාජවාදී පාලන තන්ත්‍රය සඳහා භෞතික හා දේශපාලන පූර්ව කොන්දේසි සූදානම් වීම යනාදී පසු කාලයක සිදුවුනු විග්‍රහයේ ප්‍රධාන මංපෙත් කොමියුනිස්ට් ප්‍රකාශනයේ ප්‍රබල ලෙස සටහන් වී තිබිණි.

04. කම්කරුවන්ගේ ජීවන තත්ත්වයන් පහත හෙළීමට හා ඔවුන් දිළින්දන්ගේ තත්වයන්ට පවා හෙළීමට ධනවාදයේ තිබෙන ප්‍රවණතාවය පිළිබව කොමියුනිස්ට් ප්‍රකාශනයේ ඇති සිද්ධාන්තය බරපතල ප්‍රහාරයට ලක්වී ඇත. මෙම ඊනියා දිළිඳු වීමේ න්‍යායයට විරුද්ධව පාදිලිවරු, මහාචාර්යවරු, ඇමතිවරු, පුවත්පත් කලාවේදීහු, සමාජ ප්‍රජාතන්ත්‍රවාදීහු හා වෘත්තීය සමිති නායකයෝ පෙරමුණට ආහ ශ්‍රමික වරප්‍රසාද ලද්දන් කම්කරු පංතිය වශයෙන් හෝ තාවකාලික ප්‍රවණතාවයක් ස්ථිර එකක් වශයෙන් හෝ සලකමින් ඔවුහු ශ්‍රමය වගුරන්නන් අතර වැඩීගෙන එන සෞභාග්‍යය ලකුණු නිරන්තරයෙන් සොයාගත්හ. මේ අතර ලෝකයේ බලවත්ම ධනවාදය විසින්, එනම් ඇමරිකා එක්සත් ජනපද ධනවාදය විසින්, දසලක්ෂ සංඛයාත කම්කරු පිරිස්, ප්‍රාන්තීය මහා නාගරික හෝ පුද්ගලික පුණ්‍යාධාර වලින් නඩත්තු කරනු ලබන දිළින්දන් බවට පත් කර ඇත.

05. වාඩාත් පුළුල්වන ව්‍යසන මාලාවක් හැටියට වාණිජ හා කාර්මික අර්බුදය පිළිඹිබු කර දක්වූ කොමියුනිස්ට් ප්‍රකාශනයට එරෙහිව ප්‍රතිසංස්කරණ වාදීන් දිවුරා ප්‍රකාශ කළේ ජාතික හා අන්තර්ජාතික ඒකාධිකාරී සමාගම්වල වර්ධනය විසින් වෙළඳපොලවල් පාලනය කරනු ලැබ, අර්බුදයන්ගේ ක්‍රමානුකූල අහෝසිවීමට එය තුඩු දෙනු ඇත යන්නයි. පසුගිය ශත වර්ෂයේ අවසානයත් වර්තමාන ශතවර්ෂයේ ආරම්භයත් ඇත්ත වශයෙන්ම අරබුදයන් "අහම්බෙන් සිදුවන" ඇණහිටීම් ලෙස පෙනී යන තරම් වේගවත් වූ ධනවාදී වර්ධනයත් පෙන්නුම් කළේය. එහෙත් මේ යුගය යළි පැමිණීමේ සීමාව ඉක්මවා ගොස්ඇත. අවසාන විග්‍රහයේදී සත්‍යය, මෙම ප්‍රශ්නයේදීත් මාක්ස්ගේ පැත්තේ බව ඔප්පු විය.

06. වර්තමාන රාජ්‍යයේ විධායක වනාහී මුලු ධනේෂ්වරයේ පොදු කටයුතු පාලනය කරන කමිටුවක් මිස් අන්කිසිවක් නොවේ. පුවත්පත් කලාවේ උගතෝකෝටිකයක් ලෙස සමාජ ප්‍රජාතන්ත්‍රවාදයේ නායකයින් විසින් දක්නා ලද මෙම පැහැදිළි සූත්‍රයෙහි, අත්ත වශයෙන්ම රාජ්‍යය පිළිබඳ එකම පැහැදිළි න්‍යාය අන්තර්ගත වෙයි. ධනේශ්වරය විසින් සකස් කරනු ලැබූ ප්‍රජාතන්ත්‍රවාදය වනාහී බර්න්ස්ටයින් හා කෞට්ස්කි යන දෙදෙනාම සිතූ පරිදි බාධාවක් නැතිව ඕනෑම වර්ගයක පංතිහරයකින් පිරවිය හැකි හිස් ගෝනියක් නොවේ. ධනේශ්වර ප්‍රජාතන්ත්‍රවාදය සේවය කළ හැක්කේ ධනේෂ්වරයට පමණි. බ්ලොම් හෝ ෂෝතොම්ගේ හෝ නායකත්වයෙන් වුවත්, කබලේරෝ හෝ නෙග්රින්ගේ හෝ නායකත්වයෙන් වුවත් පවතින "මහජන පෙරමුණු" ආණ්ඩුවක් වූ කලී හුදෙක් "මුළු මහත් ධනේශ්වර පොදු කටයුතු පාලනය කිරීම සඳහා පවතින කමිටුවක්" පමණි. මෙම "කමිටුව" දුර්වල අන්දමින් කටයුතු පාලනය කරන විට ධනේශ්වරය පයින් ගසා එය ඉවත් කරයි.

07. "සෑම පංති සටහනක්ම දේශපාලන සටනකි. පංති වශයෙන් කම්කරු පංතිය සංවිධානය කිරීම වනාහි අවසානයේදී එය දේශපාලන පක්ෂයක් වශයෙන් සංවිධානය කිරීමකි. එක් අතකින් වෘත්තීය සමිති කාරයෝත්, අනිත් අතින් අපරාජික සින්ඩිකලිස්ට්කාරයෝත් බොහෝ කාලයක් තිස්සේ මෙම ඓතිහාසික නියාමයන් තේරුම් ගැනීමෙන් වැළකුණහ. දූනුත් වැළකෙති. "පිරිසිදු වෘත්තීය සමිතිවාදයට එහි ප්‍රධාන අභය භූමිය වූ ඇමරිකාවේදී මරු පහරක් දූන් වැදී ඇත. අපරාජිත සින්ඩිකල්වාදයට එහි අන්තිම බලකොටුව වූ ස්පාඤ්ඤයේදී යළි පිළිසකර කළ නොහැකි පරාජයක් අත්වී ඇත. මෙතැන්හිදීත් කොමියුනිස්ට් ප්‍රකාශනය හරි බව ඔප්පු විය.

08. ධනේශ්වරය විසින් ස්ථාපිත කරන ලද නීතිමය රාමුව තුළ කම්කරු පංතියට බලය අල්ලාගත නොහැක. "තම අරමුණු ඉටුකරගත හැක්කේ පවතින සියළුම සමාජයීය තත්වයන් බලයෙන් පෙරළා දැමීම මගින් බව කොමියුනිස්ට්වරු විවෘතව ප්‍රකාශකර සිටිති. ඒ කාලයේ පැවති ව්‍යාපාරයේ නොමේරූ බව හා ප්‍රජාතන්ත්‍රවාදයේ අඩු වර්ධනය යන පදනම මත ප්‍රකාශනයේ මෙම සිද්ධාන්තය පැහැදිලි කිරීමට ප්‍රතිසංස්කරණවාදීහු උත්සාහ කළහ. නොමේරූබව වනාහි ප්‍රතිසංස්කරණවාදීන්ගේම අදහස් විදහා දක්වන ලක්ෂණයක් බව ඉතාලිය, ජර්මනිය හා වෙනත් "ප්‍රජාතන්ත්‍රවාදයන් රැසකට" අත්වූ ඉරණමින්ම ඔප්පු වෙයි.

09. සමාජයේ සමාජවාදී විපරිනාමය සඳහා කම්කරු පංතිය විසින් එම ක්‍රමයේ මාවත අවුරා සිටී එක් එක් හා සියලුම දේශපාලනමය බාධකයන් සුණුවිසුණු කළ හැකි බලයක් තම හස්තය තුළ රාශිගත කළ යුතුය. "පාලක පංතිය වශයෙන් සංවිධානය වූ කම්කරු පංතිය" යනු කම්කරු පංතියේ ආඥාදායකත්වයයි. ඒ අතරම නියම කම්කරු පංති ප්‍රජාතන්ත්‍රවාදයද එයයි. එහි පරිධිය හා ගැඹුර රඳා පවතින්නේ සංයුක්ත ඓතිහාසික තත්වයන් මතයි. සමාජවාදී විප්ලයේ මග ගන්නා වූ රාජ්‍යයන් වැඩිවෙන්නට වැඩිවෙන්නට මෙම ආඥාදායකත්වය ගන්නා ස්වරූපයන් ද වඩාත් නිදහස් වනු ඇත. වඩාත් නම්‍ය වනු ඇත. කම්කරුවන්ගේ ප්‍රජාතන්ත්‍රවාදය වඩාත් ගැඹුරට කාවැදී යනු ඇත.

10. ධනවාදයේ ජාත්‍යන්තර වර්ධනය විසින් කම්කරු පංතික විප්ලවයේ ජාත්‍යන්තර ස්වභාවය පූර්ව නියමයක් බවට පත්කර ඇත. “කම්කරු පංතියේ නිදහස්වීම් සඳහා වන ප්‍රථම කොන්දේසිය වනාහී යටත් පිරිසෙයින් ප්‍රධාන සභ්‍ය රටවල එක්සත් ක්‍රියාවයි.” ධනවාදයේ පසුකාලීන වර්ධනය විසින් අප ග්‍රහ ලෝකයේ "සභ්‍ය" හා "සභ්‍ය නොවූ" සියලුම අංශයන් කොතරම් එකට යාකර තිබේද යත් සමාජවාදී විප්ලවය පිළිබඳ ප්‍රශ්නය ස්මපූර්ණ වශයෙන් හා ක්‍රියාත්මක වශයෙන් ලෝක ස්වරූපයක් ගෙන ඇත. මෙම මූලික ප්‍රශ්නය සම්බන්ධයෙන් කොමියුනිස්ට් ප්‍රකාශනය විනාශකර දැමීමට සෝවියට් නිලධර තන්ත්‍රය උත්සාහ කළේය. එකම රට තුළ සමාජවාදය පිළිබඳ න්‍යායයේ වැරදි සහගතභාවය සොවියට් දේශයේ බොනපාට්වාදී පිරිහීමෙන් ඔප්පුවෙයි.

11. “වර්ධනයේ ගමන් මාර්ගයේදී” පංතිභේද අතුරුදහන් වී සියලුම නිෂ්පාදනය මුළු ජාතියේම සුවිසල් සාංගමික හස්තියන් තුළ රාශිගත වූ විට මහජන බලයේ දේශපාලන ස්වභාවය නැතිවී යයි. වෙනත් වචන වලින් කියතොත් රාජ්‍යය මිලීන වී යයි. අතපය එකට හිරකර තබන ඇඳුම් කට්ටලයෙන් සමාජය ගැළවෙයි. මෙය අනෙකක් නොව සමාජවාදයයි. මීට පටහැනි සූත්‍රය වන එක්සත් සෝවියට් සමාජවාදී ජනරජයේ රාජ්‍ය බලපුළුවන්කාරකම් යක්ෂාවේෂයෙන් වැඩීම එම සමාජය සමාජ වාදයෙන් ඉවතට ගමන් කරන බව ඔප්පු කරන වයක්ත සාක්ෂියකි.

12. “වැඩ කරන ජනයාට පීතෘභූමියක් නොමැත” ප්‍රකාශනයේ මෙම වදන් උද්සෝෂණික කියමනක් හැටියට මුග්ධයින් විසින් එක් වරකට වඩා තක්සේරු කර ඇත. අත්තෙන්ම එම වදන් “ධනේශ්වර පීතෘභූමිය” පිළිබඳ ප්‍රශ්නයේදී කම්කරු පංතියට සිතා මතා ගත හැකි ඒකායන නිර්දේශනය සපයයි. දෙවෙනි ජාත්‍යන්තරය විසින් මෙම නිර්දේශය උල්ලංඝණය කරනු ලැබීම නිසා සිව් අවුරුදු ආලාපාළුව පමණක් නොව ලෝක සංස්කෘතියේ වර්තමාන ඇනහිටීමද සිදුවිය. තුන්වන ජාත්‍යන්තරයේ පාවාදීම විසින් මග එළිකරන ලද ඉදිරියේදී ඇතිවීමට යන අළුත් යුද්ධය ගැන සලකා බලන විට ප්‍රකාශනය "ධනේශ්වර පීතෘභූමිය" පිළිබඳ ප්‍රශ්නයේදී ඉතාමත් විශ්වාස වන්ත උපදේශකයා ලෙස දැනටත් සිටියි.

එහෙයින් විමුක්තිය උදෙසා කරන සටනේ ඉතාමත් වැදගත් හා දැවෙන ප්‍රශ්න සම්බන්ධයෙන් වෙනත් එකකින් කළ නොහැකි අන්දමේ නිර්දේශයන් තරුණ කතුවරයින් දෙදෙනෙකුගේ මෙම ඒකාබද්ධ හා තරමක් සංක්ෂිප්ත නිපයුමෙන් ලැබෙන බව අපට පෙනී යයි. මේ සම්බන්ධයෙන් කොමියුනිස්ට් ප්‍රකාශනය සමග අන් කවර නම් ග්‍රන්ථයක් ඇතින් හෝ සැසඳිය හැකිද? එනමුත් අවුරුදු 90 ක නිෂ්පාදන බලවේගයන් හි නොදුටු විරූ වර්ධනයකින් හා දැවැන්ත සමාජ අරගලයන්ගෙන් පසුව එක්කෝ නිවැරදි කිරීම් එසේ නැතහොත් එකතු කිරීම් කොමියුනිස්ට් ප්‍රකාශනයට අවශ්‍ය නැතැයි මෙයින් නොහැඟේ. විප්ලවවාදී චින්තනය කිසිම ආකාරයකින් විරාභිවාදනයට සමාන වූවක් නොවේ. වැඩ පිළිවෙළවල් හා අනාගත වාක්‍යයන් පිරික්සුනු ලබන්නේ හා නිවැරදි කරනු ලබන්නේ මනුෂ්‍ය තර්කඥණයේ උත්තරීතර මිනුම් දණ්ඩ වන මානව අත්දැකීම් තුළිනි. කොමියුනිස්ට් ප්‍රකාශනයටත් නිවැරදි කිරීම් සහ එකතු කිරීම් අවශ්‍ය වේ. එසේ වුවද ඓතිහාසික සාක්ෂි වලින් ඔප්පු වී තිබෙන පරිදි මෙම නිවැරිදි කිරීම් හා එකතු කිරීම් සාර්ථක ලෙස

කළ හැක්කේ ප්‍රකාශනයේම පදනමට යොදා ගෙන ඇති විධි ක්‍රමයට අනුකූලවය. වඩාත් වැදගත් අවස්ථාවන් කිහිපයක් අරභයා මෙය පෙන්නුම් කිරීමට අපි උත්සාහ කරමු.

01. කිසිම සමාජ ක්‍රමයක් එහි උත්පාදන සක්‍යතාවයන් ගෙවී යන්නට පෙර ඉතිහාසය නැමැති කරළියෙන් ඉකුත්වී නොයන බව මාක්ස් ඉගැන්වීය. නිෂ්පාදන බලවේගයන්ගේ වර්ධනය හීන කිරීම නිසා ධනවාදය විසින් ප්‍රකාශනය නිශේධනය කරනු ලබයි. කෙසේ වුවත්, එම කාලපරිච්ඡේදයේ ඊට පෙර දශකයන්හිදී මෙන්ම මෙම හීනකරනු ලැබීම ස්වභාවයෙන්ම සාපේක්ෂ වූයේය. 19 වන සියවදේ දෙවැනි භාගයේදී සමාජවාදී පටන් ගැනීම මත ආර්ථිකය සංවිධානය කිරීමට හැකි වූයේ නම් එම වර්ධනයේ වේගය මැනිය නොහැකි තරමින් විශාල වන්නට තිබිණි. එහෙත් නිෂ්පාදන බලවේගයන් ලෝක යුද්ධය දක්වාම ලෝක පරිණාමයෙන් පුළුල් වෙමින් පැවතිමේ කරුණු න්‍යායික වශයෙන් බිඳ හෙළිය නොහැකි මෙම සිද්ධාන්තය විසින් අවලංගු නොකෙරේ. විද්‍යාවේ හා තාක්ෂණයේ ඉතාමත් නූතන සොයාගැනීම් මාධ්‍යයේත් ලෝක ආර්ථිකයේ තොරක් නැති අණහිටීමේ මෙන්ම පරිහානියේ යුගාරම්භය සිදුවූයේ පසුගිය අවුරුද් 20 තුලදීය. මනුෂ්‍ය වර්ගයා තමන් එක් රැස්කළ ප්‍රාග්ධනය වියදම් කිරීමට පටන්ගෙන තිබෙන අතර ශිෂ්ඨාචාරයේ සියලු අත්තිවාරම් අවුරුදු ගණනාවකට සිඳ බිඳ දැමීමට මීළඟ යුද්ධය තර්ජනය කරයි. සාපේක්ෂ වශයෙන් ප්‍රතිගාමී වූ පාලනයක් එහෙම පිටින්ම ප්‍රතිගාමී වූ පාලනයක් බවට පත්වීමට බොහෝ ප්‍රථමයෙන් ධනවාදය අහෝසි කරනු ලබතැයි ප්‍රකාශනයේ කතෘවරු සිතුහ. මෙම විපරිනාමයේ අවසන් හැඩරුව ඇතිවූයේ වර්තමාන පරම්පාරාවේ ඇස් ඉදිරිපටය. එය විසින් යුද්ධ විප්ලව හා පැසිස්ට්වාදයේ යුගය බවට අපගේ යුගය පරිවර්තනය කරනු ලැබීය.

02. ඓතිහාසික දිනයක් පිළිබඳ මාක්ස් හා එංගල්ස්ගේ වැරැද්ද, එක් අතකින් ධනවාදය තුළ ගැබ්ව තිබුණු ආනාගත හැකියාව ගැන කළ අඩු තක්සේරුවකිනුත්, අනිත් අතින් කම්කරුපංතියේ විප්ලව වාදී මුහුකුරා යෑම ගැන කල වැඩි තක්සේරුවකිනුත් පැන නැගුණේය. ප්‍රකාශනය විසින් අනුදත් අයුරින් 1848 විප්ලවය සමාජවාදී විප්ලවයක් බවට හැරුණේ නැත. එය අනාගත ධනවාදයේ නැගීමට හැකියාව ජර්මනිය වෙත විවෘත කළේය. පන්නරය ලත් විප්ලවවාදී පක්ෂයක් තම මූලිකත්වයෙහි නොමැතිව කම්කරු පංතියට ධනේෂ්වරයෙන් බලය පැහැරගත නොහැකි බවට පැරිස් කොමියුනය ඔප්පු කළේය. මේ අතර ඉන්පසු ඇතිවුණු දීර්ඝ කාලීන ධනවාදී සශ්‍රිකත්වය විසින් විප්ලවවාදී ඉදිරි බලඇණියට අධ්‍යාපනය ලබාදෙනු ලැබීම වෙනුවට ශ්‍රමික වරප්‍රසාද ලද්දන්ගේ ධනේෂ්වර පිරිහීම ඇති කරනු ලැබීය. මොවුන් කම්කරු පංති විප්ලවයෙහි තිරිගංගය බවට පත් විය. පැවති දේවල ස්වභාවය අනුව ප්‍රකාශනයෙහි කතෘවරුන්ට මෙම "ද්විසටනය" කලින් දැනගත නොහැකි විය.

03. ප්‍රකාශනයෙහි දක්වෙන්නේ ධනවාදය නිදහස් තරගයෙහි රජදහන බවයි. ප්‍රාග්ධන රාශිභූගතවීම වැඩෙමින් පැවතීම ගැන එහි සඳහන් වුවත් අප යුගයෙහි ප්‍රබලතම ධනේෂ්වර ස්වරූපය හා සමාජවාදී ආර්ථිකය සඳහා ඉතාමත් වැදගත් පූර්ව කොන්දේසිය වන ඒකාධිකාරය සම්බන්ධයෙන් ප්‍රකාශනය අවශ්‍ය නිගමනයන්ට නොබැස්සේය. ඒකාධිකාරය බවට නිදහස් තරගීය විපරිනාමය වීමේ ප්‍රවණතාවය මාක්ස් විසින් දක්වන ලද්දේ ඉන්පසුවය. එනම් "ප්‍රාග්ධනය" නැමැති

ග්‍රන්ථය මගිනි. අධිරාජ්‍යවාදය නැමැති ස්වකීය ග්‍රන්ථයෙන් ඒකාධිකාරී ධනවාදය විද්‍යාත්මකව විග්‍රහ කර දක්වූයේ ලෙනින්ය.

04. එංගලන්තයේ "කාර්මික විප්ලවය" පිළිබඳ නිදර්ශනය මූලික වශයෙන් පදනම් කරගත් කොමියුනිස්ට් ප්‍රකාශනයේ කතෘවරු අතුරු පංතිවල දියවීයාම පිළිබඳ ක්‍රියාදාමය අත්කම් සුළු වෙළඳාම් හා ගොවි ජනතාව සම්පූර්ණයෙන්ම කම්කරු පංතිකරණය වීමක් ලෙසට වුවමනාවට වඩා ඒකපාක්ෂිත අයුරින් සිත්හි මවාගත්හ. ඇත්ත වශයෙන් එම තරගයේ මූළික බලවේගය විසින් එකවරම ප්‍රගතිශීලී වුවද මිලේච්ඡවූද මෙම වැඩකටයුත්ත කිසිසේත්ම අවසන් කර නොතිබිණ. සුළු ධනේශ්වරය කම්කරු පංතික තත්ත්වයට පත්කරනවාට වඩා වේගයකින් සුළු ධනේශ්වර විනාශ කරනු ලැබීම ධනවාදය විසින් සිදුකර ඇත. තවද සුළු ධනේෂ්වර තීරු කෘත්‍රිම ලෙස පවත්වාගෙන යාමේ තම සවිඥනික ප්‍රතිපත්තිය ධනේශ්වර රාජ්‍යය විසින් කාලයක සිටම ගෙන ගොස් ඇත. ඊට ප්‍රතිවරුද්ධ ධ්‍රැවයේ තාක්ෂණය වර්ධනය වීම හා මහා පරිමාන කර්මාන්තවල ව්‍යාප්තිය විසින් බරපතල රැකියා වියුක්තියක් අවුලුවා සුළු ධනේෂ්වරයේ කම්කරු පංතිකරණය වළකත්වාලනු ලබයි. ඒ අතරම තාක්ෂණික ශිල්පී පිරිස්, පරිපාලකයින්, වාණිජ සේවකයින්, කොටින්ම කියනවා නම් ඊනියා "නව මධ්‍යම පංතියේ" වැඩිම ධනවාදයේ වර්ධනය විසින් අන්තයටම වේගවත් කර ඇත. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් අතුරුදහන් වූ බවට කොමියුනිස්ට් ප්‍රකාශනය ස්ථිර ලෙසම කියා සිටින අතරමැද පංතීහු ජර්මනිය වැනි බලවත් ලෙස කාර්මීකරණය වුනු රටක පවා ජනගහනයෙන් අඩක් පමණ නියෝජනය කරති. කෙසේ වුවත් මෙම යල් පිනූ සුළු ධනේශ්වර තීරුව කෘතීම ලෙස රැකියාවෙන් සමාජ ප්‍රතිවිරෝධයන් කිසිසේත්ම අඩුවී නැත. අනිත් අතට එය එවුන් මත විශේෂ වේදනාකාරිත්වයක් පටවා රැකියා වියුක්තවූවන්ගේ සථිර හමුදාවත් සමග ධනවාදයේ දිරායාම පිළිබඳ ඉතාමත් වේදනාකාරී ප්‍රකාශනය ඉදිරිපත් කරයි.

05. විප්ලවීය යුගයක් සඳහා සපයන ලද්දා වූ කොමියුනිස්ට් ප්‍රකාශනයෙහි ධනවාදයේ සිට සමාජවාදය වෙත සංක්‍රාන්ති වීමට අනුරූපවන අන්දමේ ඉල්ලීම් දහයක් ඇතුළත් වෙයි. මෙම ඉල්ලීම් අර්ධ වශයෙන් යල් පිනූ ඒවා වන අතර කෙසේ වුවත් ඒවා දරන්නේ ද්විතීයික වැදගත්කමක් බව මාක්ස් හා එංගල්ස් තම 1872 පෙරවදනින් ප්‍රකාශකර සිටිති. මෙම ඇගයීම බදාගත් ප්‍රතිසංස්කරණවාදීහු සංක්‍රාන්තික විප්ලවාදී ඉල්ලීම්වල තැන සමාජ ප්‍රජාතන්තීය "අවම වැඩ පිළිවෙල" විසින් සඳහටම ලබාගෙන ඇතැයි අර්ථකථනය කළහ. කවුරුත් හොඳින් දන්නා පරිදි මෙම සමාජ ප්‍රජාතන්ත්‍රීය "අවම වැඩපිළිවෙල" ධනේශ්වර ප්‍රජාතන්ත්‍රවාදයේ සීමාවන් ඉක්මවා යන්නේ නැත. ප්‍රකාශනයේ කතුවරු ඇත්ත වශයෙන් තම සංක්‍රාන්තික වැඩ පිළිවෙලහි ප්‍රධාන නිවැරදි කිරීම පැහැදිලි ලෙස පෙන්නුම් කළහ. "සැදී පැහැදී ඇති රාජ්‍ය යන්ත්‍රය නිකම් තමන් අතට ගෙන එය තමන්ගේම ප්‍රයෝජනය සඳහා කම්කරු පංතියට උපයෝගී කරගත නොහැකිය" යනු එම නිවැරදි කිරීමයි. වෙනත් වචනවලින් කියනවානම් මෙම නිවැරදි කිරීම ධනේශ්වර ප්‍රජාතන්ත්‍රවාදයට මුග්ධ උපහාර දැක්වීමට එරෙහිව යොමු කරන ලද්දකි. ධනේශ්වර රාජ්‍යය වෙනුවට කොමියුන් වර්ගයේ රාජ්‍යය මාක්ස් විසින් පසුව ගෙන හැර දක්වන ලදි. පසුව මෙම "වර්ගය " වඩාත් පරිපූර්ණ වූ සෝවියට් සභාවන්ගේ ස්වභාවය ගත්තේය. සෝවියට් සභාවන්ගෙන් තොරව හෝ කම්කරුවන්ගේ පාලනයෙන් තොරව අද විප්ලවවාදී වැඩ පිළිවෙලක් තිබිය නොහැක. ඉතිරි දේවල් ගැන කිව යුතුව

ඇත්තේ සාමකාමී පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ ඕනෑම යුගයක "යල්පැනපු" බවක් පෙනෙන ප්‍රකාශනයේ ඉල්ලීම් දහය අද එහි නියම වැදගත්කම සම්පූර්ණයෙන්ම යළි ලබාගෙන ඇති බවය. අනික් අතින් බලන විට සමාජ ප්‍රජාතන්ත්‍රීය "අවම වැඩපිළිවෙල" අතිශයින්ම පෞරාණික වී තිබේ.

06. "ජර්මන් ධනේශ්වර විප්ලවය... වහාම ඉන් අනතුරුව එන කම්කරු පංතික විප්ලවයේ පෙර ගමන් කරු වනු ඇත" යි යන බලාපොරොත්තුව පදනම් කරගෙන කොමියුනිස්ට් ප්‍රකාශනය 17 සියවසෙහි එංගලන්තයේත් 18 වන සියවසෙහි ප්‍රංශයේත් පැවති තත්වයද කම්කරු පංතියේ බොහෝ සේ වර්ධනය වූ තත්ත්වය සමඟ සැසඳූ කල්හි යුරෝපීය සභ්‍යත්වයේ වඩා දියුණු තත්වයද ගෙනහැර දක්වයි. මෙම අනාවැකිය වැරදි වන්නේ එහි දිනය සම්බන්ධයෙන් පමණක් නොවේ. වඩාත් දියුණු තත්වයක් යටතේ කිසිම ධනේශ්වර පංතියකට විප්ලවය අවසානයකට ගෙන ඒමට නොපිළිවන් බව 1848 විප්ලවය මාස කිහිපයකින්ම පෙන්නුම් කළේය. ලොකු හා මධ්‍යම ධනේශ්වර ඉඩම් හිමියන් සමග ඉතා ලගින් ඇදී සිටින අතර ජනතාවට ඇති බියෙන් විලංගු වැටී සිටී. සුළු ධනේශ්වරය බලවත් ලෙස බෙදී සිටින අතර එහි ඉහළම මුදුන් යැපෙන්නේ ධනේශ්වරයන්ය. ධනේශ්වර විප්ලවය එලෙසින් ගත් කළ එය පොදු වශයෙන් පරිසමාප්තියට ගෙන ආ නොහැකි බව පසු කලෙක යුරෝපීය හා ආසියාතික වර්ධනයේ ගමන් මාර්ගයෙන් පෙනී යයි. වැඩ වසම් කුණු කන්දල් සම්පූර්ණයෙන්ම පිස දැමීමට සිදුවිය හැක්කේ ධනේශ්වර පක්ෂ වල ආභාෂයෙන් නිදහස්වුණු කම්කරු පංතියට ගොවි ජනතාවගේ ප්‍රධානත්වයේ සිට එහි විප්ලවීය ආඥාදායකත්වය ස්ථාපිත කිරීමට හැකිවන තත්ත්වය යටතේ පමණකි. මේ අනුව ධනේශ්වර විප්ලවය සමග සමාජවාදී විප්ලවයේ ප්‍රථම අවධිය එකට ඈදී පවතී. පසුව එය සමාජවාදී විප්ලවය තුළ දිය වී යයි. ජාතික විප්ලවය මෙයින් ලෝක විප්ලවයේ පුරුකක් බවට පත්වෙයි. ආර්ථික අත්තිවාරමේ හා සියළුම සමාජ සම්බන්ධතාවයන්ගේ විපරිනාමය නොනවතින (අඛණ්ඩ) ස්වරූපයක් ගනී. ප්‍රජාතාන්ත්‍රික විප්ලවය හා කම්කරු පංතික ආඥාදායකත්වය අතර ඇති චෛන්ද්‍රීය සම්බන්ධතාවයත්, ඒ අනුව ජාත්‍යන්තර සමාජ වාදී විප්ලවයත් පිළිබඳ පැහැදිලි අවබෝධයක් ආසියාවේ, ලතින් ඇමරිකාවේ හා අප්‍රිකාවේ නොදියුණු රටවල විප්ලවවාදී පක්ෂවලට ජීවිතය හා මරණය පිළිබඳ ප්‍රශ්නයකි.

07. ධනවාදය විසින් එහි කේන්ද්‍රය තුළට නොදියුණු හා ම්ලෙච්ච රටවල් ඇද ගනු ලබන ආකාරය කොමියුනිස්ට් ප්‍රකාශනය විසින් විදහා දක්වනු ලබන අතර යටත් විජිත හා අර්ධ යටත් විජිත රටවල නිදහස සඳහා කෙරෙන සටන ගැන එහි සඳහනක් නැත. සමාජ විප්ලවය "යටත් පිරිසෙයින් ප්‍රධාන සභ්‍ය රටවලත්" මීලග අවුරුදු කිහිපය තුළ දී සිදුවිය හැක්කක් බවට මාක්ස් හා එංගල්ස් සැලකූ තත්ත්වය අනුව, ඔවුන්ට යටත් විජිත ප්‍රශ්නය නිතැතින්ම විසඳුණු එකක් විය. එය ඔවුන්ට විසඳුණු ප්‍රශ්නයක් වූයේ පීඩනයට පත් ජාතීන්ගේ ස්වාධීන ව්‍යාපාරයන්වල ප්‍රතිඵලයක් වශයෙන් නොව ධනවාදයේ ප්‍රධාන නාගරික මධ්‍යස්ථානවල කම්කරු පංතියක ජයග්‍රහනයේ ප්‍රතිඵලයක් වශයෙනි. එහෙයින් යටත් විජිත හා අර්ධ යටත් විජිත රටවල විප්ලව වාදී උපාය මාර්ග පිළිබඳ ප්‍රශ්නවලට ප්‍රකාශනය අතගසා නැත. එහෙත් මෙම ප්‍රශ්නවලට ස්වාධීන විසඳුම් අවශ්‍ය වෙයි. උදාහරණයක් වශයෙන් ගනිතොත් "ජාතික පීතෘභූමිය" දියුණු රටවල ඉමහත් විනාශකාරී ඓතිහාසික තිරිංගයක් වන බව පැහැදිලි ලෙස පෙනුන නමුත් ස්වාධීන පැවැත්මක් සඳහා සටන් කිරීමට

අනිවාර්යයෙන් පෙළඹී සිටින නොදියුණු රටවල් එය සාපේක්ෂ වශයෙන් තවමත් ප්‍රගතිශීලී සාධකයක්ව පවතී.

"පවතින සියළුම සමාජ හා දේශපාලන තත්ත්වයන්ට එරෙහිව සෑම තැනකම පවතින හැම විප්ලවවාදී ව්‍යාපාරයකටම කොමියුනිස්ට්වරු සහයෝගය දෙති"යි ප්‍රකාශනය කියා සිටී. සිය අධිරාජ්‍යවාදී පීඩකයන්ට විරුද්ධව කළුජාතිකයින් ගෙන යන ව්‍යාපාරය වනාහි පවතින තත්ත්වයන්ට එරෙහි වන ඉතාමත් වැදගත් හා බලවත් ව්‍යාපාරයන්ගෙන් එකකි. එම නිසා සුදු ජාතික කම්කරු පංතියේ පූර්ණවූද කොන්දේසි විරහිත වූද අසීමිත වූද සහයෝගය ඊට ලැබිය යුතුය. පීඩිත ජාතීන් සඳහා විප්ලවීය උපාය ගොඩනැංවීම පිළිබඳ ගෞරවය හිමිවන්නේ ලෙනින්ටය.

08. ක්‍රමය අතින් නොව කරුණු අතින් ප්‍රකාශනයේ වඩාත්ම යල් පිනූ කොටස වනාහි 19 වන සියවසේ මුල් භාගයේ "සමාජවාදී" සාහිත්‍යය පිළිබඳ විවේචනය (III පරිච්ඡේදය) හා විවිධ විරුද්ධ පක්ෂ සමග සංසන්දනාත්මකව බලන විට කොමියුනිස්ට්වරුන්ගේ ස්ථාවරය පිළිබඳ නිර්වචනයයි. (IV පරිච්ඡේදය) කොමියුනිස්ට් ප්‍රකාශනයේ ලැයිස්තුගත කර ඇති ව්‍යාපරයන් හා පක්‍ෂයන් එක්කෝ 1848 විප්ලවයෙන් නැතහොත් ඉන්පසු අතිවුනු ප්‍රතිවිප්ලවයෙන් කොතරම් දුරට අතු ගෑවී ගියේද යත් ඒවායේ නම් දැන ගැනීම සඳහා කෙනෙකුට ඓතිහාසික ශබ්දකෝෂයක් බැලිය යුතු වෙයි. කෙසේවුවත් මෙම කොටසේදී පවා ප්‍රකාශනය ඇතැම් විට කලින් පරම්පරාවට වඩා අපට දැන් වඩාත් කිට්ටුය. මාක්ස්වාදයේ නොබෙදුනු ව්‍යාප්තිය පැවති දෙවනි ජාත්‍යන්තරය මල්ඵල හටගත් සමයේදී ප්‍රාග් මාක්සියානු සමාජවාදී අදහස් තීරණාත්මක ලෙස අතීතයට තල්ලුවී ගියේ යයි සිතන්නට ඉඩ තිබිණ. අද තත්ත්වය මීට වඩා වෙනස්ය. සෑම පියවරක් පාසාම සමාජ ප්‍රජාතන්ත්‍රවාදයේ හා කොමින්ටානයේ දිරාපත්වීම තුළින් බිහිසුණු දෘෂ්ඨීමය රෝගතුරවීම් උත්සන්න කරනු ලබයි. මහළු චින්තනය ළදරු බවට පත්වූවා සේය. විද්‍යාත්මක සමාජ වාදය විසින් බොහෝ කලකට පෙර වළලා දමන ලද ධර්මයන් සැවොම ගළවා ගන්නා සූත්‍ර සොයන ශාස්තෘ වරුන් විසින් මෙම පරිහානි යුගයේදී අළුතින් සොයා ගනු ලබයි.

ඉතා ගැඹුරට කිදා බසින වෙනස්කම් පසුගිය දශකයන් විසින් හඳුන්වාදී ඇත්තේ විරුද්ධ පක්ෂයන් පිළිබඳ ප්‍රශ්නය සම්බන්ධයෙනි. මෙය සිදුවී ඇත්තේ අළුත් පක්ෂ විසින් පරණ ඒවා පසෙකට අතුගා දමා තිබීම අතින් පමණක් නොව පක්ෂවල ස්වභාවය ඒවායේ අන්‍යොන්‍ය සම්බන්ධතාවයන් අධිරාජ්‍යවාදී යුගයේ තත්වයන් තුළ ප්‍රබල ලෙස වෙනස්වී තිබීමත් අතිනි. එහෙයින් කොමියුනිස්ට් ජාත්‍යන්තරයේ ප්‍රථම සභාවාරයන් හතරේ වඩාත් වැදගත් ලියවිලිද බොල්ෂෙවික්වාදයේ අත්‍යාවශ්‍ය සාහිත්‍යය සහ හතරවෙනි ජාත්‍යන්තරයේ සම්මේලනවල තීරණයන්ද මගින් කොමියුනිස්ට් ප්‍රකාශනය පුළුල් කළ යුතු වෙයි.

මාක්ස් අනුදත් අන්දමට කිසිම සමාජ ක්‍රමයක් එය තුළ නිදන්ගත සත්‍යතාවයන් සිදී යනතුරු කරලියෙන් පිටමං නොවන බව අපි කලින් සඳහන් කළෙමු. එහෙත් යල්පැනූ සමාජ ක්‍රමයක්වත් ප්‍රතිරෝදකයක් නොදක්වා එහි තැන අළුත් ක්‍රමයකට ලබා ගැනීමට ඉඩ නොදෙයි. තදබල අන්දමේ පංති සටන එනම් විප්ලවය යනු සමාජ තන්ත්‍රවල වෙනසක පූර්ව නිගමනයයි. ආයුෂ ගෙවීගිය

ධනේෂ්වර ක්‍රමයක් විරෝදාර පහරකින් පෙරලාදැමීමට කිසියම් හේතුවකින් කම්කරු පංතියට බැරිවුවහොත් එමගින් විනාශ වී අධිෂ්ඨාන සුන්වී ගිය සුළු ධනේශ්වරය තම අස්ථාවර පාලනය පවත්වාගෙන යාම සඳහා පැසිස්ට්වාදයේ මිනිමරු හමුදාවක් බවට හැරවීම හැර කළ හැකි අන්දෙයක් මූල්‍ය ප්‍රාග්ධනයට නොමැත. සමාජ ප්‍රජාතන්ත්‍රයවාදයේ ධනේශ්වර පරිහානිය හා සුළු ධනේශ්වරයේ පැසිස්ට්වාදී පරිහානිය හේතුව හා ඵලය මෙන් එකිනෙකා හා වෙළී පවතී.

වර්තමානයේදී තුන්වන ජාත්‍යන්තරය විසින් දෙවැන්නටත් වඩා සියළුම රටවල වැඩ කරන්නන් රැවටීමේ හා කලකරවීමේ කටයුත්ත කරගෙන යනු ලැබේ. ස්පාඤ්ඤ කම්කරු පංතියේ ඉදිරි පෙරමුණු මරා දැමීමෙන් මොස්කව් මගින් කුලියට ගත් තුච්ඡයින් විසින් පැසිස්ට්වාදයට පාර කපනු ලබනවා පමණක් නොව කම්කරු පංති පරිශ්‍රමයේ හොඳ කොටසක්ද ඝාතනය කරනු ලබයි. මනුෂ්‍ය සංස්කෘතියේ අර්බුදයක් බවට වඩ වඩාත් පත්වන්නා වූ ජාත්‍යන්තර විප්ලවයේ පුළුල් අර්බුදය විප්ලවවාදී නායකත්වයේ අර්බුදය හැටියට හරය වශයෙන් ගොනුකර දැක්විය හැකිය.

කොමියුනිස්ට් පක්ෂයේ ප්‍රකාශනය විසින් සම්බන්ධ කරනු ලබන්නා වූ ශ්‍රේෂ්ඨ සම්ප්‍රදායේ උරුමක්කාරයා වශයෙන් හතරවෙනි ජාත්‍යන්තරය පැරණි කර්තව්‍යයන් ඉෂ්ඨ කිරීම සඳහා අළුත් ක්‍රියාධරයන්ට අධ්‍යයනයක් ලබාදීගෙන යයි. න්‍යාය වනාහි සාමාන්‍යකරණය කරනු ලැබූ යථාර්ථයයි. විප්ලවාදී න්‍යායයන්ට දක්වන අවංක ආක්ලපයකින් ප්‍රකාශ වන්නේ සමාජ යථාර්ථය යළි ගොඩ නැංවීමට ඇති හෘදයාංගම අවශ්‍යතාව යයි අඳුරු මහාද්වීපයේ දකුණු දිග්භාගයෙහි සිටින අපගේ සම දෘෂ්ඨිකයින් අප්‍රිකන් භාෂාවට ප්‍රකාශනය ප්‍රථමයෙන්ම පරිවර්තනය කරනු ලබන්නක් වීම මාක්ස්වාදී චින්තනය අද ජීවත් වන්නේ හතරවෙනි ජාත්‍යන්තරයේ ධජය යටතේ පමණක්ය. යන්න විචිත්‍ර ලෙස විදහා දක්වන්නකි. අනාගතය හිමි එයටයි. කොමියුනිස්ට් ප්‍රකාශනයේ ශත සංවත්සරය පවත්වන විට හතරවෙනි ජාත්‍යන්තරය අපගේ ග්‍රහලෝකය මත ඇති තීරණාත්මක විප්ලවීය බලවේගය බවට පත්ව තිබෙනු ඇත.

1937 ඔක්තෝම්බර් 30, කොයොකන්හිදී ය.

පරිවර්තනය: එච්.ඒ. සෙනෙවිරත්න